ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

සත්මෙත්සිත්හවුල සමිතිය (සංස්ථාගත කිරීමේ)

සත්මෙත්සිත්හවුල සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ
පනත් කෙටුම්පතකි

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයන්ත සමරවීර මහතා විසින්
2015 දෙසැම්බර් මස 11 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[49 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 11.00 යි. **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

සත්මෙත්සිත්හවුල සමිතිය
(සංස්ථාගත කිරීමේ)

සත්මෙත්සිත්හවුල සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

''සත්මෙත්සිත්හවුල'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එකී සමිතිය සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එකී පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩ දීම යෝග්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2015 අංක දරන සත්මෙත්සිත්හවුල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසු, (මෙහි මින් මතු ''සමිතිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සත්මෙත්සිත්හවුල සමිතිය දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් ද, සත්මෙත්සිත්හවුල සමිතිය'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සත්මෙත්සිත්හවුල සමිතිය සංස්ථාගත කිරීම.

(2) සංස්ථාව, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා වන ස්වේච්ඡා සමාජ සේවා

සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

නිබ්බාන ගාමී පටිපදාව අවධාරනය කර ගනිමින් එම පරමාර්ථය ඉටු කර ගැනීම උදෙසා —

(අ) බෞද්ධ භික්ෂූන් වහන්සේලාට හා දසසිල් මාතාවන්ට මහණ දම් පිරීමට සහ අධි සීල සමාදානය, අධි සමාධි සමාදානය, අධි ප්‍රඥා සමාදානය සඳහා අනුබල දීම සහ ඊට පහසුකම් සැලසීම ;

(ආ) ගිහි උපාසක උපාසිකාවන්ට ශීල, සමාධි, ප්‍රඥා වර්ධනය කර ගැනීම සඳහා අනුබල දීම හා ඊට පහසුකම් සැලසීම ;

(ඇ) බුද්ධ දේශනාවට අනුකූලව, මෙම සමිතිය යටතේ පිහිටුවා ඇති සේනාසන පද්ධතියට අනන්‍ය වූ සහ ආවේනික වූ භාවනා කර්මස්ථාන අභ්‍යාස පටිපාටියට අනුකූලව භාවනාව ප්‍රගුණ කිරීමට මෙම සේනාසන පද්ධතියට සම්බන්ධ සිව්වනක් පිරිසට පහසුකම් සැලසීම ;

(ඈ) මෙම සේනාසන පද්ධතියට අනුගත වන ස්වාමීන් වහන්සේලා එක්ව සමගියෙන් වාසය කරන තාක් කල් එම ඇත්තන්ට, චීවර, නිර්මාංශ පින්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය යන සිවුපසයෙන් සත්කාර කිරීම ;

(ඉ) මෙම සේනාසන පද්ධතියට අනුගත වන දස සිල් මෑණියන් වහන්සේලා එක්ව සමගියෙන් වාසය කරන තාක් කල් එම ඇත්තන්ට, චීවර, නිර්මාංශ පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය යන සිවුපසයෙන් සත්කාර කිරීම ;

(ඊ) මෙම සේනාසන පද්ධතියට අනුගත වන උපාසක පිරිස, එක්ව සමගියෙන් වාසය කරන තාක් කල් එම ඇත්තන්ට, වස්ත්‍ර, නිර්මාංශ පින්ඩපාත, සේනාසන ගිලානප්‍රත්‍ය යන සිවුපසයෙන් සත්කාර කිරීම;

(උ) මෙම සේනාසන පද්ධතියට අනුගත වන උපාසිකා පිරිස, එක්ව සමගියෙන් වාසය කරන තාක් කල් එම ඇත්තන්ට, වස්ත්‍ර, නිර්මාංශ පින්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍ය යන සිවුපසයෙන් සත්කාර කිරීම ; සහ

(ඌ) සේනාසන පද්ධතියේ පැවැත්මට හානිකරවන්නා වූ යම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අනුශාසක මණ්ඩලයේ එකඟත්වය ඇතිව මැදිහත් වී කටයුතු කිරීම.

4. සංස්ථාවේ අරමුණු, සංස්ථාවේ වැඩ සහ ඒ හා සමගාමීව ආණ්ඩුවේ හෝ යම් පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් මගින් කරගෙන යන යම් වැඩ අතර ගැටීමක් උද්ගත නොවන ආකාරයට කරගෙන යා යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාතක යම් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක වැඩ සමග ගැටීමක් ඇති නොවීමට සංස්ථාව සහතික විය යුතු බව

5. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම මේ පනතේ විධිවිධානවලට සහ 9 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් ව, එම රීති යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු හෝ පත් කර ගනු ලබන්නා වූ සභාපතිවරයකු ලේකම්වරයකු, භාණ්ඩාගාරිකවරයකු සහ 9 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන හෝ පත් කරගනු ලබන තවත් සාමාජිකයන් යම් සංඛ්‍යාවකින් සමන්විත වූ, කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය වන්නේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) (අ) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ආරම්භවන දිනට පෙරාතුව ම වූ දිනයේ දී සමිතියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, ඔවුන් 9 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව අලුත් මණ්ඩලයක් පත් කරනු ලබන තෙක් නොකඩවා ධුර දැරිය යුතු ය.

(ආ) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට අවුරුදු එකක් ඇතුළත පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(3) (අ) කළමනාකරණ මණ්ඩලයේ සෑම ධුර දරන්නෙකුම අවුරුදු තුනක කාලයක් සඳහා පත් කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු අතර, සෑම ධුර දරන්නෙකු ම එම අවුරුදු තුනක කාලසීමාව ඉකුත් වූ පසු නැවත පත් කර ගැනීමට හෝ තෝරාපත් කර ගැනීමට හිමිකම් ලබන්නේ ය.

(ආ) යම් ධුර දරන්නෙකු මිය යෑම, ඉල්ලා අස්වීම, නොහැකියාව හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක, කළමනාකරණ මණ්ඩලය විසින්, සංස්ථාවේ රීතිවලට සැලකිල්ලක් දක්වමින් එම පුරප්පාඩුව පිරවීම සඳහා තැනැත්තකු පත් කිරීම හෝ තෝරාපත් කිරීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ පත් කරගනු ලැබූ හෝ තෝරාපත් කරගනු ලැබූ තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක්, හුදෙක් එහි සාමාජිකයන්ගේ පුරප්පාඩුවක් තිබීම හෝ එහි යම් සාමාජිකයකු නම් කිරීම හෝ තෝරාපත් කර ගැනීමේ යම් දෝෂයක් තිබුණු පමණින් අවලංගු සේ නොසැලකිය යුතු ය.

අනුශාසක මඩුල්ල.

6. මෙම සමස්ථ සේනාසන පද්ධතියේම ධර්ම විනයානුකූල කරුණු සහ සංස්ථාවේ කළමනාකරණ හා පරිපාලනය සම්බන්ධයෙන් අනුශාසනා කිරීම උදෙසා 9 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව පත් කරගනු ලබන අනුශාසක මඩුල්ලක් තිබිය යුත්තේ ය.

උපදේශක මණ්ඩලය.

7. කළමනාකරණ මණ්ඩලය විසින්, නිශ්චය කරනු ලබන සංස්ථාවේ යම් යම් කටයුතුවල දී අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා පත් කරනු ලබන උපදේශක මණ්ඩලයක් තිබිය යුතු අතර, එම උපදේශක මණ්ඩලයට සාමාජිකයන් පත් කර ගැනීම සහ ඊට අදාළ කාරණා 9 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් පාලනය විය යුතු ය.

සංස්ථාවේ බලතල.

8. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත සඳහන් බලතල ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, අත්පත් කර ගැනීම, ඉදි කිරීම, අලුත්වැඩියා කර ගැනීම හෝ වෙනත් ආකාරයකින් ලබා

ලබා ගැනීම සහ සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ අදහසින් අනුශාසක මණ්ඩලයේ අනුමතය ඇතිව කළමනාකරණ මණ්ඩලය විසින් යෝග්‍ය යයි සලකනු ලබන පරිදි බැහැර කිරීම ;

(ආ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම සහ මුදල් හෝ ද්‍රව්‍ය වලින් ත්‍යාග, පරිත්‍යාග, ප්‍රදාන හෝ වෙනත් යම් ආධාර භාර ගැනීම හෝ එකතු කිරීම ;

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන්, මණ්ඩලය විසින්, මුදල් විෂයය පවරා ඇත්තේ යම් අමාත්‍යවරයකු වෙත ද එම අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ඒ සඳහා ලබා ගත යුතු ය ;

(ඇ) සංස්ථාවේ අරමුණු සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල් කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට ආයෝජනය කිරීම ;

(ඈ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයේ යෙදවීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසාන කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය සහ ඔවුනට සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වැටුප් හෝ දීමනා ගෙවීම ;

(ඉ) කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ වෙනත් ගිණුම් විවෘත කිරීම සහ ඒවා පවත්වාගෙන යාම සහ වසා දැමීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි ගිවිසුම් හෝ කොන්ත්‍රාත්වලට ඍජුව හෝ තත්කාර්ය සඳහා සංස්ථාව විසින් බලය පවරනු ලැබූ නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් ඇතුළු වී ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාවේ යෙදවීම ;

(ඩ) කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි සංස්ථාවේ යම් කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන අනුශාසක මණ්ඩලය සහ උපදේශක මණ්ඩලය ද ඇතුළුව යම් මණ්ඩලය සහ කමිටු ආදිය පත් කර ගැනීම ;

(ඪ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම හෝ අරමුදල් සපයා ගැනීම ; සහ

(ණ) සංස්ථාවේ අරමුණු නිසි ලෙස සහ ඵලදායී ලෙස කරගෙන යෑම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන අනෙකුත් සියලු දෑ කිරීම.

සංස්ථාවේ රීති.

9. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම සහ ඔවුන් විසින් ගෙවිය යුතු ගාස්තු ;

(ආ) කලමනාකරණ මණ්ඩලයේ, අනුශාසක මණ්ඩලයේ, උපදේශක මණ්ඩලයේ සහ පත්කර ගනු ලැබිය හැකි වෙනත් මණ්ඩල හෝ කමිටුවල සාමාජිකයන් තෝරාපත් කර ගැනීම හෝ පත්කර ගැනීම, ඔවුන්ගේ බලතල කාර්යය, කර්තව්‍ය සහ ධුර කාලය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන් සහ සේවකයන්ගේ පත්වීමේ නියම හා කොන්දේසි, බලතල, කර්තව්‍ය, කාර්ය සහ පාරිශ්‍රමික ;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ හෝ අනුශාසක මණ්ඩලය සහ උපදේශක මණ්ඩලය ද ඇතුළු වෙනත් යම් මණ්ඩලයක හෝ කමිටුවක රැස්වීම් කැඳවීම් සහ රැස්වීම් පැවැත්වීමේ

දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන වේලාව, ස්ථානය, ඒ රැස්වීම්වල දැන්වීම්, න්‍යාය පත්‍රය සහ ඒ සඳහා ගණපූරණ මෙන්ම ඒවායෙහි කටයුතු පවත්වාගෙන යාම ;

(ඉ) කලමනාකරණ මණ්ඩලය හෝ අනුශාසක මණ්ඩලය සහ උපදේශක මණ්ඩලය ද ඇතුළුව අනිකුත් මණ්ඩල හෝ කමිටුවල සහ සංස්ථාවේ සාමාජිකයන් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය සහ කළමනාකරණය කිරීම ; සහ

(උ) සංස්ථාවේ සමාන්‍ය කටයුතු කළමනාකරණය කිරීම, එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන සෑම රීතියක්ම (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම, එවැනිම රැස්වීමක දී එවැනි ම ආකාරයට සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

10. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පරිත්‍යාග, දායක මුදල්, සම්මාදම්, ගාස්තු හෝ ප්‍රදාන හෝ මුල්‍ය ආයෝජන වශයෙන් මීට පෙර ලැබුණු හෝ මින් මතු සංස්ථාවට ලැබෙන සියලු මුදල් (මෙහි මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, එම අරමුදල කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක හෝ බැංකුවල පවත්වාගෙන යා යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් යම් චංචල සහ නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම සියලු දේපල අනුශාසක මණ්ඩලයේ අනුමතය ඇතිව විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, 9 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

මුදල් සහ දේපල අදාළ කර ගැනීම.

12. සංස්ථාවේ මුදල් හා දේපල. මෙහි දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කර ගත යුතු අතර, එහි කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත ඍජුවම හෝ වක්‍රව ලාභාංශ, ප්‍රසාද, දීමනා, ලාභ හෝ වෙනත් යම් ආකාරයකින් ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

ගිණුම් සහ විගණනය.

13. (1) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගනකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි ගණකාධිකාරී සමාගමක් ,

අදහස් වේ.

(4) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

වාර්ෂික වාර්තාව.

14. (1) මණ්ඩලය විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග ඒ වාර්තාව අදාළ වන වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර බුද්ධශාසන හා ආගමික කටයුතු විෂයභාර අමාත්‍යවරයගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

සමිතියට අයවිය යුතු සහ සමිතියෙන් ගෙවිය යුතු ණය.

15. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී භාරය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව ගෙවනු ලැබිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු සියලු ණය සහ, භාරයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

16. (1) තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් යම් සාධන පත්‍රයක තම නම අත්සන් කළ යුතු සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එම අත්සන් කිරිම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමටකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

(2) සංස්ථාවේ මුද්‍රාව එහි ලේකම්වරයා හෝ කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

17. (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපලක් ඉතිරි වුවහොත් එම දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපල ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් එවැනි ආයතනයකට හෝ ආයතනවලට එම දේපල දීම හෝ පැවරීම කළ යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

(2) සමිතිය විසුරුවා හැරිය ද, පිරිසට දේපල භාවිතා කළ හැකි පරිදි ඒ අවස්ථාවේ වැඩ වසන (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙර මහා සභා රැස්වීමක දී සංස්ථාවේ පැමිණ ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් යෝග්‍ය එම ආයතනය හෝ ආයතන නිශ්චය කළ යුතු ය.

18. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

19. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.